සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය
# Mathugama Education Zone

## දෙවන වාර පරීක්ෂණය - 2023

කෘෂි හා ආහාර තාක්ෂණය - I පත්‍රය | 10 ශ්‍රේණිය | කාලය පැය 01 යි.

නම:..........................................................................................................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති ( 1 ), ( 2 ), ( 3 ), ( 4 ) යන පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර පත්‍රයේ සැසඳෙන අංකයට ( X ) ලකුණ යොදන්න.

01.අඹන් ගඟ හරස්කර වේල්ලක් බැඳ උතුරු පළාතට ජලය ගෙන යාමට ඉදි කළ වාරි ඇළ මාර්ගය වන්නේ,
( 1 ) ඇළහැර ඇළ ය. ( 2 ) මිණිපේ ඇළ ය. ( 3 ) යෝධ ඇළ ය. ( 4 ) ජය ගඟ ය.

02.වැව් බැම්මට ජලය මඟින් ඇතිවන පීඩනය අවම කිරීමට පැරැන්නන් විසින් ඉදිකළ සුවිශේෂී නිර්මාණය වන්නේ,
( 1 ) මඬ සොරොව්ව ය. ( 2 ) ගොඩ සොරොව්ව ය. ( 3 ) සලපනාව ය. ( 4 ) බිසෝ කොටුව ය.

03. නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ බිහි වූ විශාලම හා මුල්ම බහුකාර්ය යෝජනා ක්‍රම පිළිවෙළින් දැක්වූවිට,
( 1 ) උඩවලව හා මහවැලි බහුකාර්ය යෝජනා ක්‍රම වේ.
( 2 ) මහවැලි හා නිල්වලා බහුකාර්ය යෝජනා ක්‍රම වේ.
( 3 ) ගල්ඔය හා මහවැලි බහුකාර්ය යෝජනා ක්‍රම වේ.
( 4 ) මහවැලි හා ගල්ඔය බහුකාර්ය යෝජනා ක්‍රම වේ.

04. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට වැඩිම දායකත්වයක් දක්වන අංශය හා ප්‍රතිශතය වන්නේ,
( 1 ) කෘෂි අංශය - 60 % වේ. ( 2 ) බෝග වගාව - 45 % වේ.
( 3 ) සේවා අංශය - 60 % වේ. ( 4 ) කාර්මික අංශය - 65 % වේ.

05. පහත දැක්වෙන සාධක අතුරින් පරිසර උෂ්ණත්වය කෙරෙහි බලපාන සාධක වන්නේ,
A - උච්චත්වය B - සමකයේ සිට ඇති දුර C - පස් වර්ගය D - වන ගහනයය
( 1 ) A, B හා C පමණි. ( 2 ) A, B හා D පමණි. ( 3 ) B, C හා D පමණි. ( 4 ) A, C හා D පමණි.

06. ශ්‍රී ලංකාවට දිගම දිවා කාලය පවතින දිනය ලෙස සලකනු ලබන්නේ,
( 1 ) දෙසැම්බර් 21 දින ය. ( 2 ) ජූනි 21 දින ය. ( 3 ) ජූලි 21 දින ය. ( 4 ) මාර්තු 21 දින ය.

07. අඩු උෂ්ණත්වයක දී පුෂ්පීකරණය සිදු වන බෝග වර්ග දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
( 1 ) කැරට් හා බෝංචි ය. ( 2 ) කැරට් හා බීට් ය. ( 3 ) මුං හා කව්පි ය. ( 4 ) බෝංචි හා දඹල ය.

08. IM හා WL යන සංකේතවලින් දැක්වෙන ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප පිළිවෙළින් දැක්වූ විට,
( 1 ) උඩරට තෙත් කලාපය හා මැදරට තෙත් කලාපය වේ.
( 2 ) උඩරට වියළි කලාපය හා පහතරට තෙත් කලාපය වේ.
( 3 ) මැදරට අතරමැදි කලාපය හා පහතරට තෙත් කලාපය වේ.
( 4 ) මැදරට තෙත් කලාපය හා උඩරට තෙත් කලාපය වේ.

09. යම්කිසි ප්‍රදේශයක වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව කෙරෙහි බලපාන ප්‍රධාන කාලගුණික සාධක වන්නේ,
( 1 ) ආලෝකය හා උෂ්ණත්වය යි. ( 2 ) උෂ්ණත්වය හා සුළඟ යි.
( 3 ) උච්චත්වය හා ආලෝකය යි. ( 4 ) ආලෝකය හා සුළඟ යි.

10. බෝග වගාවට ආලෝකයේ බලපෑම සිදු වන ආකාර දෙකක් වන ආලෝක තීව්‍රතාවය හා ආලෝකය පවතින කාලසීමාව මැනීමට භාවිතාකරන උපකරණ දෙක පිළිවෙළින් දැක්වූවිට,
( 1 ) සූර්ය විකිරණමානය හා සූර්ය දීප්තමානය වේ.
( 2 ) සූර්ය දීප්තමානය හා සූර්ය විකිරණමානය වේ.
( 3 ) සූර්ය විකිරණමානය හා සාපේක්ෂ ආර්ද්‍රතාමානය වේ.
( 4 ) සූර්ය දීප්තමානය හා අනිලමානය වේ.

11. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන වර්ෂාව සක්‍රීයව පවතින කාලවකවානුව වන්නේ,
( 1 ) නොවැම්බර් සිට දෙසැම්බර් මාසය දක්වා ය. ( 2 ) දෙසැම්බර් සිට පෙබරවාරි මාසය දක්වා ය.
( 3 ) මැයි සිට සැප්තැම්බර් මාසය දක්වා ය. ( 4 ) ඔක්තෝබර් සිට නොවැම්බර් මාසය දක්වා ය.

12. බෝග වගාවට බලපාන කාලගුණික පරාමිතියක් වන සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩිවීම මගින්,
( 1 ) බීජ වැඩි කාලයක් ගබඩා කර තබා ගත හැකිවේ. ( 2 ) ශාක රෝග ආසාදනය අඩුවේ.
( 3 ) ශාක රෝග ආසාදනය වැඩිවේ. ( 4 ) කෘමි පළිබෝධ හානි අඩුවේ.

13. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාපයක් වන මැදරට අතරමැදි කලාපයට ලැබෙන වාර්ෂික වර්ෂාපතනය වන්නේ,
( 1 ) මි.මී. 2500 ට වැඩි ය. ( 2 ) මි.මී. 1750 ට අඩු ය.
( 3 ) මි.මී. 1750 – මි.මී. 2500 අතර ය. ( 4 ) මි.මී.1000 - මි.මී. 2250 අතර ය.

14. වාර්ෂික වර්ෂාපතනය 2350 mm පමණ වන උච්චත්වය 955 m වන කෘෂි දේශගුණික කලාපය හඳුන්වන සංකේතය වන්නේ,
( 1 ) IL ය. ( 2 ) IU ය. ( 3 ) WL ය. ( 4 ) WU ය.

15. කාලගුණ මධ්‍යස්ථානයක ඇති සුළං දිශා දර්ශකයේ ඊ හිස උතුරු දෙසට යොමුවී ඇති අවස්ථාවක සුළං හමන්නේ,
( 1 ) උතුරු දිශාවේ සිට දකුණු දිශාවට ය. ( 2 ) දකුණු දිශාවේ සිට උතුරු දිශාවට ය.
( 3 ) නැගෙනහිර දිශාවේ සිට බටහිර දිශාවට ය. ( 4 ) බටහිර දිශාවේ සිට නැගෙනහිර දිශාවට ය.

16. වර්ෂාමානයක් ස්ථානගත කිරීමේ දී පුනීල කට පිහිටුවිය යුත්තේ පොළව මට්ටමේ සිට ,
( 1 ) 30 cm උසින් ය. ( 2 ) 50 cm උසින් ය. ( 3 ) 3 m උසින් ය. ( 4 ) 1.2 m උසින් ය.

17. පාංශු වයනය පරීක්ෂාවේ දී වියළා කුඩු කරගත් පස් සාම්පලයක් 0.2 mm සිදුරු සහිත පෙනේරයකින් හැලුවිට පෙනේරය තුළ ඉතිරි වන්නේ ,
( 1 ) රළු වැලි ය. ( 2 ) සියුම් වැලි ය. ( 3 ) බොරළු ය. ( 4 ) බොරළු හා රළු වැලි ය.

18. ක්ෂාරීය පසක් උදාසීන තත්වයට පත්කර ගැනීමට පසට යොදන ද්‍රව්‍යයක් වන්නේ,
( 1 ) හුණුගල් ය. ( 2 ) ඩොලමයිට් ය. ( 3 ) ජිප්සම් ය. ( 4 ) යූරියා ය.

19. යම් පසක $P^H$ අගය 7.3 – 8.5 අතර අගයක් ගනී නම් එම පස,
( 1 ) ප්‍රබල ආම්ලික පසකි. ( 2 ) උදාසීන පසකි. ( 3 ) ආම්ලික පසකි. ( 4 ) ක්ෂාරීය පසකි.

20. ශ්‍රී ලංකාවේ බහුලව පවතින නයිස් පාෂාණය නිර්මාණය වීමට හේතුවන පාෂාණ වර්ගය වන්නේ,
( 1 ) පෙග්මටයිට් ය. ( 2 ) හුණුගල් ය . ( 3 ) ග්‍රැනයිට් ය. ( 4 ) ෂේල් ය.

21. පාංශු පැතිකඩක "යටි පස" ලෙස හඳුන්වන්නේ කුමන කලාපය ද ?
( 1 ) විශෝධන කලාපය යි. ( 2 ) සංචායක කලාපය යි.
( 3 ) මාතෘ ද්‍රව්‍ය කලාපය යි. ( 4 ) මාතෘ පාෂාණ කලාපය යි.

22. පාංශු ජල ආකාරවලින් බෝගවලට අවශෝෂණය කරගත හැකි ජල ආකාරය වන්නේ,
( 1 ) ජලාකර්ෂණ ජලය යි. ( 2 ) කේෂාකර්ෂණ ජලය යි.
( 3 ) ගුරුත්වාකර්ෂණ ජලය යි. ( 4 ) භූගත ජලය යි.

23. ගොවියෙකු විසින් වගාවකට පොහොර යෙදූ විගස වර්ෂාවක් ඇතිවූවත් එම පොහොර සේදී නොගොස් පසේ රැඳී තිබෙන්නේ,

( 1 ) පසේ කැටායන හුවමාරු ධාරිතාවය නිසා ය. ( 2 ) පාංශු ආම්ලිකතාවය නිසා ය.
( 3 ) පසේ $P^H$ අගය නිසා ය. ( 4 ) පාංශු අවකාශ නිසා ය.

24. පෝෂක රඳවා තබා ගැනීමට උපකාරීවන පසේ ඇති කලිල වර්ග දෙක වන්නේ,

( 1 ) මැටි හා රොන්මඩ ය. ( 2 ) මැටි හා හියුමස් ය.
( 3 ) මැටි හා බොරළු ය. ( 4 ) රොන්මඩ හා හියුමස් ය.

25. වායුගෝලයේ පවතින ප්‍රමාණයට සාපේක්ෂව පාංශු වාතයේ,

( 1 ) $CO_2$ වැඩි ය. ( 2 ) $O_2$ වැඩි ය. ( 3 ) $N_2$ වැඩි ය. ( 4 ) $CH_4$ වැඩි ය.

26. වයන පරීක්ෂාවේ දී පස් සාම්පලයක් තෙත් කර ගුලිකර, දෙඅත්ලේ රෝල්කර, මුදුවක් ආකාරයට සැකසීමේ දී කැඩේ නම් එම පස,

( 1 ) වැලි පසක් විය යුතු ය. ( 2 ) මැටි පසක් විය යුතු ය.
( 3 ) වැලි ලෝම පසක් විය යුතු ය. ( 4 ) මැටි ලෝම පසක් විය යුතු ය.

27. පාංශු ව්‍යූහ ආකාරවලින් බෝග වගාවට වඩාත් ම සුදුසු වන්නේ,

( 1 ) ස්ථම්භික ව්‍යූහය යි. ( 2 ) තණි කණිකා ව්‍යූහයයි.
( 3 ) කැටිති ව්‍යූහය යි. ( 4 ) අණු කෝණකාර කුට්ටි ව්‍යූහය යි.

28. ශ්‍රී ලංකාවේ පාංශු ඛාදනයට බලපාන ප්‍රධානතම කාරකය වන්නේ,

( 1 ) මිනිස් ක්‍රියාකාරකම් ය. ( 2 ) සුළඟ ය. ( 3 ) මුහුදු රළ ය ( 4 ) වර්ෂා ජලය ය.

29. ශ්‍රී ලංකාවේ මහවැලි ඉඩම්වල ලවණතාවය ඇතිවීම ප්‍රධාන ගැටලුවක් බවට පත්වී තිබේ. ඊට බලපාන මූලික කාරණාව වන්නේ,

( 1 ) ඛනිජ ජීර්ණයෙන් ලවණ එකතුවීම යි. ( 2 ) මුහුදු සුළඟින් ලවණ පැමිණීම යි.
( 3 ) අධික ලෙස පොහොර භාවිත කිරීම යි. ( 4 ) වාරි ජලය හරහා ලවණ පැමිණීම යි.

30. දෙවැටි ක්‍රමය මගින් පාංශු සංරක්ෂණය සඳහා බහුලව යොදා ගන්නා ශාකයක් වන්නේ,

( 1 ) ගෝතමාලා ය. ( 2 ) වල් සූරියකාන්ත ය. ( 3 ) ග්ලිරිසීඩියා ය. ( 4 ) පියුරේරියා ය.

31. විද්‍යාත්මක බෝග වර්ගීකරණයේ දී බණ්ඩක්කා බෝගය අයත්වන ශාක කුලය වන්නේ,

( 1 ) කුකර්බිටේසියේ ය. ( 2 ) සොලනේසියේ ය. ( 3 ) පොඒසියේ ය. ( 4 ) මැල්වේසියේ ය.

32. කොළ පොහොර ලෙස බහුලව භාවිතයට යොදා ගන්නා ශාක වර්ග දෙකකි.

( 1 ) සැල්වීනියා හා දියගෝවා ( 2 ) අඩනහිරියා හා ග්ලිරිසීඩියා
( 3 ) ග්ලිරිසීඩියා හා කෙසෙල් ( 4 ) ජපන් ජබර හා ගඳපාන

33. මාෂ බෝග, ධාන්‍ය බෝග, තෙල් බෝග හා අපනයන බෝග යන වර්ගවලට අයත්වන බෝග නිවැරදිව දැක්වෙන්නේ,

( 1 ) වී, කව්පි, පොල්, කහ ය. ( 2 ) වැටකොළු, කුරක්කන්, තල, තේ ය.
( 3 ) වී.කව්පි, පොල්,කෙසෙල් ( 4 ) කව්පි,මෙනේරි, සූරියකාන්ත, ගම්මිරිස් ය.

34. බෝගයේ වයස අනුව බෝග වර්ගීකරණයේ දී වාර්ෂික බෝග පමණක් අයත්වන බෝග කාණ්ඩය වන්නේ,

( 1 ) මෑ, කරවිල,බණ්ඩක්කා හා පතෝල ය. ( 2 ) මුං, කරවිල, අඹ හා දඹල ය.
( 3 ) පොල්, මුං, මිරිස් හා රබර් ය. ( 4 ) රබර්, අඹ, කොස් හා දෙල් ය.

35. යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරවන ද්විතීයික බිම් සැකසීමේ උපකරණ යුගලයක් වන්නේ,

( 1 ) කොකු නගුල හා රොටවේටරය යි. ( 2 ) තැටි නගුල හා ඇණ දත් පෝරුව යි.
( 3 ) තල පෝරුව හා සැහැල්ලු යකඩ නගුල යි. ( 4 ) ජපන් රොටරි වීඩරය හා රිජරය යි.

36. ප්‍රාථමික බිම් සැකසීම, ද්විතීයික බිම් සැකසීම හා අතුරුයත් ගෑම යන බිම් සැකසීමේ අවස්ථා වන්වල දී භාවිත කිරීමට සුදුසු බිම් සැකසීමේ උපකරණ පිළිවෙළින් දක්වා ඇති නිවැරදි වරණය,

( 1 ) තැටි නගුල, ජපන් වල් පැළ නෙලනය හා තැටි පෝරුව යි.

( 2 ) තැටි පෝරුව, තැටි නගුල හා ජපන් වල් පැළ නෙලනය යි.

( 3 ) හෝ උපකරණය, රොටවේටරය හා ජපන් වල් පැළ නෙලනය යි.

( 4 ) හැඩ ලෑලි නගුල, තැටි පෝරුව හා ජපන් වල් පැළ නෙලනය යි.

37. රිජරය නම් වූ බිම් සැකසීමේ උපකරණයෙන් සිදු කරන කාර්යය වන්නේ,

( 1 ) පස් කැට සියුම්ව පොඩි කිරීම ය. ( 2 ) පස සියුම්ව සකසා පස මට්ටම් කිරීම ය.

( 3 ) භූමියෙහි වැටි හා කාණු සැකසීම ය. ( 4 ) පස් පිඩැලි කැපීම හා පෙරලීම ය.

38. වගා භූමියක බිම් සැකසීමේ දී ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

( 1 ) වගා භූමියෙහි ජලවහන කාණු සෑදීම ය. ( 2 ) පස් කැට පොඩි කර සියුම්ව සැකසීම ය.

( 3 ) බෝගය අනුව සුදුසු පාත්ති සැකසීම ය. ( 4 ) පස් පිඩැලි කැපීම හා පෙරලීම ය.

39. බීජ සංස්ථාපනයේ දී කුඩා බීජ පේළි සහිතව හෝ රහිතව වැපිරිය හැකිය. එවැනි බීජ කාණ්ඩය වන්නේ,

( 1 ) රාබු, අබ,තල හා වට්ටක්කා ය. ( 2 ) වී, තල, කව්පි හා බණ්ඩක්කා ය.

( 3 ) කුරක්කන්, තල, රාබු හා කැරට් ය. ( 4 ) බඩඉරිඟු, කව්පි, සලාද හා තක්කාලි ය.

40. සම්මත තවානක නිවැරදි පළල හා දිග පිළිවෙළින් දැක්වූ විට,

( 1 ) 1 m හා 3 m වේ. ( 2 ) 3 m හා 1 mවේ. ( 3 ) 1.5 m හා 3 mවේ. ( 4 ) 30 cm හා 3 m වේ.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය
# Mathugama Education Zone

## දෙවන වාර පරීක්ෂණය - 2023

| කෘෂි හා ආහාර තාක්ෂණය - II පත්‍රය | 10 ශ්‍රේණිය | කාලය පැය 02 යි. |
|---|---|---|

නම:.......................................................................................................................................

සැලකිය යුතුයි.

❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. එක්තරා ගොවියෙකු තම ගොවිපොළ තුළ නිසි කාලයට වැසි ලැබීමත් සමඟ සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම ද භාවිත කරමින් උපරිම අස්වැන්නක් අපේක්ෂාවෙන් ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය භාවිත කරමින් විවිධ බෝග වර්ගවලට උචිත ලෙස භූමිය සකසමින් ඉතා ඉහළ අස්වනු සහිත සාර්ථක ගොවිපොළක් පවත්වා ගෙන යයි.

(1) අතීතයේ පැවති යැපුම් කෘෂිකර්මාන්තය ලෙස හැඳින්වූයේ කුමක්දැයි කෙටියෙන් දක්වන්න.
(2) මෙම ගොවිපොලේ පැවතිය හැකි ගොවිතැන හා බැඳුණු සංස්කෘතික අංගයක් නම් කරන්න.
(3) ගොවිපොලේ දැකිය හැකි බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් බෝග වර්ග 02 ක් නම් කරන්න.
(4) රටේ සංවර්ධනයට මෙම ගොවිපොලෙන් දායකත්වය ලැබෙන ආකාර 02 ක් දක්වන්න.
(5) නිරිත දිග මෝසම් වැසි ඇසුරින් වගා කරන වගා කන්නය කුමක් ද ?
(6) වර්ෂාපතනයට අනුගතව බෝග වගාව ආරම්භ කළ යුතු ආකාරය දක්වන්න.
(7) වර්ෂාපතනය නිසා බෝග වගාවට සිදු විය හැකි අහිතකර බලපෑම් 02 ක් ලියන්න.
(8) මෙම ගොවිපොලේ මූලික බිම් සැකසීමට යොදා ගන්නා උපකරණ 04 ක් නම් කරන්න.
(9) a) ගොවිපොලේ තිබිය හැකි සොලනේසියේ කුලයේ බෝග වර්ග 02 ක් දක්වන්න.
b) බීජ කෙළින්ම ක්ෂේත්‍රයේ සිටුවන එළවළු බෝග වර්ග 02 ක් ලියන්න.
(10) ගොවිපොලේ කාණු දැමීමට භාවිත කළ හැකි විශේෂිත උපකරණයක් නම් කරන්න.

( ල. 02 x 10 =20 )

02. අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට වාරි තාක්ෂණය මුසු වී ස්වයංපෝෂී ආර්ථිකයක් බවට දියුණු වී පැවති බවට බොහෝ සාක්ෂි හමුවේ.

i. වැවක ප්‍රධාන අංග 04 ක් නම් කරන්න. ( ල. 02 )
ii. ඉන් එක් අංගයක සුවිශේෂී කාර්යයක් සඳහන් කරන්න. ( ල. 02 )
iii. අතීතයේ කෘෂිකර්මාන්තයට රාජ්‍ය අනුග්‍රහය ඉහළින් පැවති බවට සාක්ෂි 02 ක් ඉදිරිපත් කරන්න. ( ල. 03 )
iv. දේශීය වාරි පද්ධතිය බිඳ වැටීමට බලපෑ හේතු 02 ක් සඳහන් කරන්න. ( ල. 03 )

03. පාරිසරික සාධක සමග වගා කටයුතු ගළපා ගැනීමෙන් උපරිම අස්වැන්නක් ලබා ගැනීම ගොවියාගේ අපේක්ෂාවයි.

i. ශ්‍රී ලංකාව දේශගුණික කලාපවලට බෙදා දක්වන්නේ කුමන සාධකයක් පදනම් කරගෙන ද ? ( ල. 02 )
ii. තෙත් කලාපය බෙදා දක්වන කෘෂි දේශගුණික කලාප 03 නම් කරන්න. ( ල. 03 )
iii. වියළි කලාපය බෙදා දක්වා ඇති කෘෂි පාරිසරික කලාප ගණන කීය ද? ( ල. 02 )
iv. කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ ඇති වැදගත්කම් 02 ක් සඳහන් කරන්න. ( ල. 03 )

04. බෝග වගාවේ දී පාංශු සාධකය පිළිබඳව සැලකිලිමත්වීම අතිශයින් වැදගත් වේ. එසේ නොවුණහොත් අස්වැන්න කෙරෙහි එය සෘජුවම බලපෑම් කරයි.

i. පහත සඳහන් පාංශු ගැටලු මඟ හරවා ගත හැකි ප්‍රතිකර්මය බැගින් දක්වන්න.

a. පාංශු ආම්ලිකතාවය

b. පාංශු ලවණතාවය

c. පාංශු ඛාදනය ( ල.03 )

ii. පාංශු පැතිකඩක රූප සටහනක් ඇඳ එහි අඩංගු ස්ථර නිවැරදිව නම් කරන්න. ( ල. 04 )

iii. ශ්‍රී ලංකාවේ බහුල ව ව්‍යාප්තවී ඇති ප්‍රධාන පස් කාණ්ඩ 03 ක් දක්වන්න. ( ල. 03 )

05. ආදර්ශ ගෙවත්තක පහත දැක්වෙන බෝග වර්ග කිහිපයක් හොඳින් වර්ධනයවී ඇතිබව දැකගත හැකි විය. ( අඹ, අන්නාසි, වම්බටු, කහ, ඉඟුරු, මිරිස්, වට්ටක්කා, කැකිරි, කව්පි, මුං, දාස්පෙතියා, බතල, කිරිඅල, වල් සූරියකාන්ත, කුරක්කන්, බඩඉරිඟු, සෝගම් )

i. පැළැටි ආකාරයේ වර්ධන විලාසයක් පෙන්වන බෝග 02 ක් නම් කරන්න. ( ල. 02 )

ii. ඉඟුරු හා කහ යන බෝග අයත් වන ශාක කුලය නම් කරන්න. ( ල. 01 )

iii. ගොවිපොලේ වැටට සිටුවීමට සුදුසු බෝගයක් නම් කරන්න. ( ල. 01 )

iv. ෆැබේසියේ කුලයේ හා කුකර්බිටේසියේ කුලයට අයත් බෝග වර්ග 02 ක් බැගින් දක්වන්න.

( ල. 04 )

v. බෝග වර්ගීකරණයේ වැදගත්කම් 02 ක් සඳහන් කරන්න. ( ල. 02 )

06. සිටුවන බීජයක් හෝ පැළයක් හොඳින් වර්ධනය වීමටත් මනා වූ පාංශු පරිසරයක් ගොඩ නැගීමටත් නිසි ලෙස බිම් සැකසීම හා මනා ලෙස බෝග සංස්ථාපනය කළ යුතු ය.

i. මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර 02 දක්වන්න. ( ල. 02 )

ii. අතින් ක්‍රියාකරන, යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන හා සත්ත්ව බලයෙන් ක්‍රියා කරන බිම් සැකසීමේ උපකරණයක් බැගින් දක්වන්න. ( ල. 03 )

iii. බෝග සංස්ථාපනය ලෙස හඳුන්වන්නේ කුමක්දැ යි දක්වන්න. ( ල. 02 )

iv. බෝග සංස්ථාපන ක්‍රම 03 ක් නම් කරන්න. ( ල. 03 )

07. පාසල් ගෙවතු වගාවේ යෙදෙන සිසුන් ගෙවතු වගා කටයුතු කරන අතරතුරේදීම ගුරුතුමියගෙන් කරුණු විමසමින් ගෙවතු වගාව පිළිබඳ බොහෝ ඉගෙනුම් අත්දැකීම් ලබා ගන්නා ලදී.

i. උත්ස්වේදනය නිසා ශාක මැලවීම පාලනය කරගත හැකි ක්‍රම 02 ක් දක්වන්න. ( ල. 02 )

ii. පාංශු ඛාදනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. ( ල. 03 )

iii. විද්‍යාත්මක බෝග වර්ගීකරණය අනුව බෝගයක් හැඳින්වීමට භාවිත කරන පද දෙක නම් කරන්න.

( ල. 02 )

iv. වගා භූමියක යොදන තවාන් පාත්ති වර්ග 02 ක් නම් කර ඊට සුදුසු බෝගය බැගින් දක්වන්න.

( ල. 03 )

මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone
මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone
මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone
මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone
මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone
මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone
මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone

**මතුගම අධ්‍යාපන කලාපය**
**Mathugama Education**

# දෙවන වාර පරීක්ෂණය - 2023

| කෘෂි හා ආහාර තාක්ෂණය | 10 ශ්‍රේණිය |
|---|---|

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (01) - 1 | (11) - 2 | (21) - 2 | (31) - 4 |
| (02) - 4 | (12) - 3 | (22) - 2 | (32) - 2 |
| (03) - 4 | (13) - 3 | (23) - 1 | (33) - 4 |
| (04) - 3 | (14) - 2 | (24) - 2 | (34) - 1 |
| (05) - 2 | (15) - 1 | (25) - 1 | (35) - 1 |
| (06) - 2 | (16) - 1 | (26) - 4 | (36) - 4 |
| (07) - 2 | (17) - 1 | (27) - 3 | (37) - 3 |
| (08) - 3 | (18) - 3 | (28) - 4 | (38) - 4 |
| (09) - 2 | (19) - 4 | (29) - 4 | (39) - 3 |
| (10) - 1 | (20) - 3 | (30) - 3 | (40) - 1 |

## II පත්‍රය

01. 1) මිනිසාගේ පැවත්ම සඳහා අවශ්‍ය ආහාර, ඇඳුම් හා ඖෂධ වැනි දෑ කෘෂිකර්මය ආශ්‍රිත ව තමා විසින් ම සපයාගත් අතර එය යැපුම් කෘෂිකර්මාන්තය ලෙස හඳුන්වයි.

2) අත්තම් ක්‍රමය, කයිය, අලුත් සහල් මංගල්‍යය, වැවයි දාගැබයි ගමයි පන්සලයි, ජනකවි ආදිය...

3) කෝපි, තේ, රබර්, කොකෝවා, සින්කෝනා, පොල්, අර්තාපල්, ගෝවා, කැරට්, බීට්, රාබු, ලීක්ස්

4) පෝෂණ අවශ්‍යතා සැපයීම, රැකියා නියුක්තිය, විදේශ විනිමය ඉපයීම, කාර්මික අංශයට අමුද්‍රව්‍ය සැපයීම, කාර්මික හා සේවා අංශවල වෙළඳපොළ පුළුල් කිරීම හා සංස්කෘතිය පෝෂණය කිරීම

5) යල කන්නය

6) මඳ වැසි ආරම්භයේ දී බිම් සැකසීම ආරම්භ කර වර්ෂාව වැඩි කාලයේ දී බෝගයේ වර්ධනයට අවස්ථාව ලබාදීම.

7) වැසි වැඩිවීමෙන් උපකරණවල ඇලීම නිසාත්, වැසි අඩුවීමෙන් පස තදවීම නිසාත් උපකරණ භාවිතය අපහසුවීම, අධික වැසි නිසා බීජ කුණුවේ. වැසි අඩුවීමෙන් බීජ ප්‍ර රෝහණය නොවේ, අධික වැසි නිසා පැළ ඇද වැටීම, කුණුවීම, රෝග ව්‍යාප්තිය ද සිදුවේ. වැසි අඩුවීමෙන් පැළ මැලවේ, අධික වැසි නිසා ධාන්‍ය අස්වනු මේරීම ප්‍රමාද වේ. පළතුරුවල පැණි රස අඩුවේ. ධාන්‍ය බීජ කරලේ දී ම පැළවේ, ජල ගැලීම් නිසා පැළ ඇද වැටීම හා පැළ මැලවී යයි.

8) උදැල්ල, නගුල් වර්ග, මුල්ලු, පෝරු වර්ග, රේක්ක, රිජරය, රොටවේටරය

9) a) බටු, මිරිස්, තක්කාලි, අර්තාපල්, ඉන්නල, මාළු මිරිස්

b) ෆැබේසියේ කුලය, කුකර්බිටේසියේ කුලය, මැල්වේසියේ කුලය

10) රිජරය ( ඇලි වැටි දමනය ) ( ල. 2 X 10 = 20 කි )

02) I) හා II)

| | | |
|---|---|---|
| වැව් බැම්ම | - | වැවට එකතු වන ජලය එක්රැස් කර තබා ගැනීම |
| සලපනාව | - | වැව් බැම්ම ජල පහරින් සේදී යාම පාලනය කිරීම |
| පිටවාන | - | වැවට එකතුවන අතිරික්ත ජලය පාලනය කිරීම |
| සොරොව්ව | - | වාරිමාර්ග ඇළට වැවෙන් ජලය මුදා හැරීම |
| බිසෝකොටුව | - | වැව් බැම්මට ඇතිවන පීඩනය පාලනය කරමින් ජලය මුදා හැරීම |
| වාරිමාර්ග ඇළ | - | වගා භූමිය වෙත ජලය රැගෙන යාම |
| වැව් ඉස්මත්ත | - | වැවේ ජල පෝෂක ප්‍ර දේශය ලෙස ක්‍රියාත්මකවීම ( I හා II සඳහා ල. 2 බැගින් ) |

III. මහ පරාක්‍රමබාහු රජුගේ වැසි ජලය භාවිතය පිළිබඳ ප්‍රකාශය, වැව් බැඳි රාජ්‍යය නැමති අන්වර්ථ නාමය, මින්නේරිය දෙවියන් යන දේව සංකල්පය, ශ්‍රේෂ්ඨ රජවරුන්ගේ වාරි නිර්මාණ පිළිබඳ ඉතිහාස වාර්තා , අදටත් දැකගත හැකි විශාල වාරි පද්ධතිය ( ල. 3 )

IV. රජරට රාජධානිය නිරිත දෙසට සංක්‍රමණයවීම, අධිරාජ්‍යවාදීන්ගේ ආක්‍රමණ හා විනාශකාරී ප්‍රතිපත්තිවල බලපෑම, වැවිලි ආර්ථික බෝග වගාවට ප්‍රමුඛතාවය ලබාදීම, වී ඇතුළු දේශීය ආහාර බෝග ආනයනයට යොමුවීම, මුඩු ඉඩම් පණත වැනි ක්‍රම ඔස්සේ ග්‍රාමීය ජනයාගේ ඉඩකඩම් උදුරා ගැනීම. ( ල. 3 )

03) I.) වාර්ෂික වර්ෂාපතනයේ ප්‍රමාණය හා වර්ෂාපතනයේ ව්‍යාප්තිය ස්වභාවය අනුවයි. ( ල. 2 )

II. උඩරට තෙත් කලාපය, මැදරට තෙත් කලාපය, පහතරට තෙත් කලාපය ( ල. 3 )

III. කලාප 11 කි. ( ල. 2 )

IV. සමාකාර දේශගුණික තත්ත්ව ඇති ප්‍රදේශ හඳුනා ගැනීමට, යල මහ කන්නවල වගා කටයුතු සැලසුම් කිරීමට, එක් එක් කලාපයට උචිත බෝග හඳුනා ගැනීමට, කෘෂි ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට, කෘෂි ඉඩම් කලාපීයකරණය කිරීමට, ඉඩම් සංවර්ධන හා සංරක්ෂණ කටයුතු පහසු කර ගැනීමට ( ල. 3 )

04) I.) a) හුණු වර්ග යෙදීම (ඩොලමයිට්, අලුහුණු ), ආම්ලික පොහොර නිතර නිතර යෙදීමෙන් වැළකීම ( ල. 1)

b) ගෙන්දගම් එකතු කිරීම, පසට කාබනික ද්‍රව්‍ය යෙදීම, ජලයෙන් සෝදා හැරීම ( ල.1 )

c) පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීම( ගල්වැටි, කාණු, හෙල්මළු යෙදීම ), පාංශු දේහයෙන් අංශු වෙන්වීම අවම කිරීම, පස් අංශු ප්‍රවාහනය අවම කර ක්ෂේත්‍ර යේ ම රඳවා ගැනීම, ආවරණ බෝග වගාව, වසුන් යෙදීම, අවම බිම් සැකසීම, පස මතුපිටින් ගලන ජලයේ වේගය පාලනය කිරීම ( ල. 1 )

II.)



O කාබනික ද්‍රව්‍ය

A විශෝධන කලාපය / උඩු පස

B සංචායක කලාපය / යටි පස

C මාතෘ ද්‍රව්‍ය / මූලික ද්‍රව්‍ය

R මාතෘ පාෂාණ ( ල. 4 )

III) රතු දුඹුරු පස, රතු කහ පොඩ්සොලික් පස, දියලු පස ( ල. 3 )

05).I.) අන්නාසි, මිරිස්, වම්බටු, කව්පි, මුං, දාස්පෙතියා, කුරහන්, බඩඉරිඟු, සෝගම් ( ල. 2 )

II.) සින්ජිබරේසියේ කුලයට අයත්වේ. ( ල. 1 )

III.) වල් සූරියකාන්ත ( ල. 1 )

IV.) ෆැබේසියේ කුලය - කව්පි, මුං කුකර්බිටේසියේ කුලය - වට්ටක්කා, කැකිරි ( ල. 4 )

V.) බිම් සැකසීමේ දී, පොහොර යෙදීමේ දී, බද්ධ කිරීමට ශාක තෝරා ගැනීමේ දී, රසායනික වල්නාශක යෙදීමේ දී, පළිබෝධ පාලනයේ දී වැනි අවස්ථාවල දී වැදගත් වේ. ( ල. 2 )

06.) I.) ප්‍රාථමික බිම් සැකසීම හා ද්විතීයික බිම් සැකසීමයි. ( ල. 2 )

II.) අතින් - උදැල්ල, මුල්ලු වර්ග, රේක්ක, හෝව වර්ග, අත් පෝරුව, ජපන් රොටරි වීඩරය, තුන් පුරුක් කල්ටිවේටරය, අත් ඉස්කෝප්පය

සත්ත්ව බලයෙන් - දේශීය ගැමි නගුල, ඇණ දත් පෝරුව, සැහැල්ලු යකඩ නගුල

යන්ත්‍ර බලයෙන් - තැටි නගුල, තැටි පෝරුව, තල පෝරුව, හැඩ ලෑලි නගුල, ජපන් පරිවර්ත්‍ය නගුල, දැති පෝරුව (කොකු නගුල ), රොටවේටරය ( භ්‍රමණ පෝරුව ), රිජරය ( ඇලි වැටි දමනය ) ( ල. 3 )

III.) බීජ, පැළ වැනි රෝපණ ද්‍රව්‍ය වගා භූමියක ස්ථාපිත කිරීම බෝග සංස්ථාපනය නම් වේ. ( ල. 2 )

IV.) බීජ වැපිරීම( අහඹු ක්‍රමය, පේළියට ), පැළ සිටුවීම ( තනි පේළි ක්‍රමය, දෙපේළි ක්‍රමය, ත්‍රිකෝණ ක්‍රමය, සමචතුරස්‍ර ක්‍රමය, පඟේ බෙදීම් ක්‍රමය ) ( ල. 3 )

07.)I.) ශාකයේ පත්‍ර කොටස් ඉවත් කර සිටුවීම, අනවශ්‍ය අතු කප්පාදු කිරීම, පොලිතීන් ආවරණ යෙදීම, සූර්ය ප්‍රචාරක ව්‍යුහ භාවිත කිරීම, හරිතාගාර වැනි වගා ව්‍යුහ තුළ වගා කිරීම ( ල. 2 )

II.) යම් ස්ථානයක පිහිටි පස් අංශු හෝ සමූහන ලෙස වෙන්වී වෙනත් ස්ථානයක් වෙත ගසාගෙන ගොස් තැන්පත්වීමේ ක්‍රියාවලිය පාංශු ඛාදනයයි. ( ල. 3 )

III.) ගණ නාමය හා සුළු නාමය යි. ( ල. 2 )

IV.) උස් පාත්ති - මිරිස් , වම්බටු, තක්කාලි, රාබු, ලීක්ස්, ගෝවා

ගිල්වූ පාත්ති - මුකුණුවැන්න, ගොටුකොළ, කන්කුන්, කොහිල, නීරමුල්ලිය ( ල. 3 )


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න